## විනිවිද

# මිනිසා දිවි ගෙවන්නේ වෛද්‍ය ක්‍රමවල ආනුභාවයෙන් ද?

**මහාචාර්ය කාලෝ පොන්සේකා**

**අද ආයුර්වේදයේ භාවිත කරනු ලබන ප්‍රතිකර්ම රාශියකට පදනම් වී ඇත්තේ, නූතන වෛද්‍ය විද්‍යාව භාවිත කරනු ලබන ප්‍රතිකර්ම මූලධර්ම බවය. තවද ආයුර්වේදයේ භාවිත කරනු ලබන ඖෂධ රසායනික වශයෙන් නිෂ්ඵල බව යථා කාලයෙහිදී ඔප්පු වුවත්, ඒවා භාවිතයෙන් ශාරීරික රෝගවලින් පෙළෙන 35% වත් මානසික රෝග වලින් පෙළෙන 40% වත් තාවකාලික සුවයක් හෝ ලැබෙනු ඇත.**

මානවයා පෘථිවි තලයෙහි බිහි වූයේ වසර දස ලක්ෂයකට පමණ පෙරදීය. ලිඛිත වෛද්‍ය ක්‍රමයක් වශයෙන් ආයුර්වේදය වසර පන්දහසකට වඩා පැරණි නොවේ. නූතන වෛද්‍ය විද්‍යාව බිහිවී අවුරුදු දෙසීයක්වත් ගතවී නැත. ඒ හෙයින් මානවයා අඛණ්ඩව මෙලොව ජීවත් වූයේ ග්‍රන්ථාරූඪ වූ ආයුර්වේදය නිසාවත් නූතන වෛද්‍ය විද්‍යාව නිසාවත් නොවේ. වෙනත් වචනවලින් කියතොත්, මානවයා අවුරුදු දශලක්ෂයක් පමණ කාලයක් තිස්සේ ජීවත් වූයේ වත්මන් මිනිසා සතු වෛද්‍ය ක්‍රම ආනුභාවයෙන් නොවේ.

සැබෑ නතු එසේ වන බැවින්, මෙහිදී පැන නගින ප්‍රශ්නය වනුයේ, මනුෂ්‍ය වර්ගයා මෙතරම් දීර්ඝ කාලයක් තුළ නොනැසී [illegible]ත් වීමට සමත් වූයේ කෙසේ ද යන්නයි. ජීවය පෘථිවියේ බිහි වූ ද පටන් එය අහෝසි කරලීමට තුඩු දුන් විවිධ බලවේග පෘථිවියෙහි තිබිණ. ඒ සකල උපද්‍රව අභිබවනය කොට ජීවයේ අද දක්වා ඇතිවී තිබෙන උපරිම වර්ධනය ලෙස සැලකිය හැකි මානවයා නොනැසී ජීවත් වූයේ මිනිස් සිරුරේ අන්තර්ගත බල මහිමයෙකිනි. බොහෝ ලෙඩ රෝග මැඩලීමට හැකි ආවේණික නුවණක් මිනිස් සිරුරේ අන්තර්ගත වී තිබේ. සිරුරේ කිසියම් කොටසක හානියක්, තුවාලයක්, කැඩුමක්, බිඳුමක් සිදුවූ කල්හි ඒ කොටස යළිත් ප්‍රකෘතිමත් කිරීමේ හැකියාවක් සිරුර සතුව ඇත. සිරුර රෝගාතුර වූ කල එය බොහෝ විට තිනැතින්ම සුවපත් වන්නේය. ඒ මිනිස් සිරුරේ ස්වභාවයයි.

ස්වභාවයෙන්ම සුවපත් වන රෝගයකින් පෙළෙන අයකු කිසියම් ප්‍රතිකාරයක් ලැබීමෙන් අනතුරුව සුවපත් වුවහොත් ඒ ප්‍රතිකාරය සුවපත් වීම අතර ඇත්තේ පූර්ව - අපර සම්බන්ධතාවයක් විනා හේතු ඵල සම්බන්ධතාවක් නොවේ. නිදර්ශනයක් වශයෙන් අප කාහටත් හුරු පුරුදු ප්‍රතිශ්‍යාව වැළඳුණු අයෙකුට කිසිදු ප්‍රතිකාරයක් නොකළ ද සාමාන්‍යයෙන් දින කීපයකින් ඒ පුද්ගලයා සුවපත් වනු ඇත. ඒ රෝගියාට නූතන වෛද්‍ය විද්‍යාවට අනුව හෝ ආයුර් වේදයට අනුව හෝ, යුනානි ක්‍රමයට අනුව හෝ සිද්ධ ක්‍රමයට අනුව හෝ හෝමියෝපති ක්‍රමයට අනුව හෝ චීන කටු චිකිත්සා ක්‍රමයට අනුව හෝ ප්‍රතිකාර කළත් නොඑසේ නම් රෝගියා වෙනුවෙන් බලි යාගයක් , දෙහි කැපීමක් ආදිය කළත්, කීප දවසකින් රෝගියා සුවපත් වනු ඇත.

ඔහු සුවපත් වූයේ යටකී ප්‍රතිකාර ක්‍රමවල අනුභාවයෙන් නොවේ. සුවපත් වූයේ ඔහුගේ සිරුරේම අනුභාවයෙනි. ඔහු සුවපත් වූයේ යට කී ප්‍රතිකාර ක්‍රමයකට අනුකූලව ප්‍රතිකාර කරනු ලැබුවායින් පසුව වුවත්, එයින්ම ඔහු සුවපත් වූයේ එකී ප්‍රතිකාර ක්‍රමය හේතු කොට ගෙනය කියා ගම්‍යමාන නොවේ. සැම හේතු - ඵල සම්බන්ධතාවයක්ම පූර්ව - අපර සම්බන්ධතාවක් වුවත් සැම පූර්ව - අපර සම්බන්ධතාවයක්ම හේතු - ඵල සම්බන්ධතාවයක් නොවන බැවිනි. නිතැතින්ම දින කීපයකින් සුව වන රෝගයක් කිසියම් ප්‍රතිකර්මයක් කළායින් පසුවත් දින කීපයකින් සුව වේ නම් ප්‍රතිකාරය නිසා සිදුවූ වෙනස කිම?

රෝග මැඩලීමට මිනිස්සු සිරුර සතු ආවේණික බලය කිනම් ආරක්ෂක උපක්‍රම මත පදනම් වේද? සිරුර සතු උපක්‍රම බාහිර, රසායනික හා සෛලමය ආරක්ෂක උපක්‍රම වශයෙන් බෙද විස්තර කළ හැකිය. කිනම් වෛද්‍ය ක්‍රමයක ආධාරයක් ඇතත් නැතත් ඒ ආරක්ෂක උපක්‍රමවල පිහිට සිරුරට නොලැබුණහොත් කවර නම් වෛද්‍ය ක්‍රමයට හෝ අපේ පණ රැකදීමට කළ හැකි මහා වැඩක් නැත.

සිරුරේ ආරක්ෂක විධිවිධාන අක්‍රිය වුවහොත් මරුවා අන ළහය. ඒඩ්ස් නැමැති රෝගය භයානක වන්නේ ඒ මගින් සිරුරේ ආවේණික ආරක්ෂක උපක්‍රම අක්‍රිය කරවන බැවිනි. එවැනි රෝගියෙකු අභිමුඛයෙහිදී සැම වෛද්‍යවරයෙක්ම අසරණ වේ. ඔහුට කළ හැකි අර්ථවත් ඵලදායි කිසිවක් නැති බැවිනි. මාරාන්තික සටනකට වැද සිටින රෝගියාට කිසිදු අමතර හානියක් අමනෝඥ ප්‍රතිකාර මගින් නොකිරීමට ඔහු වගබලා ගත යුතුය. සමහර රෝගීන් මිය යන්නේ තමන්ට වැළඳී තිබෙන රෝගය හේතු කොට ගෙන නොවේ. තමන්ට කරන ලද ප්‍රතිකාර හේතු කොට ගෙනය. බොහෝ අවස්ථාවල රෝගියෙකුට කළ හැකි හොඳම ප්‍රතිකාරය කිසිදු ප්‍රතිකාරයක් නොකිරීමයි. මේ කරුණ පිළිබඳව සයිඩෙන්හැම් නැමැති ඉංග්‍රීසි ජාතික සම්භාවනීය වෛද්‍යවරයා වරක් මෙසේ පැවසීය. සැම විටම සොබා දහමට වෛද්‍ය ශිල්පයේ අනුග්‍රහය අත්‍යාවශ්‍ය වේය කියා සිතීම මුළාවකි... මම එක දෙයක් නිහතමානීව කැමැත්තෙමි. සමහර අවස්ථාවලදී රෝගියාගේ සුබසෙත මෙන්ම මගේ කීර්තිය ද තකා ගෙන මවිසින් රෝගියාට කළ එකම ප්‍රතිකාරය කිසිදු ප්‍රතිකාරයක් නොකිරීමය. නූතන වෛද්‍ය විද්‍යාවේ භාවිත කරනු ලබන සමහර ඖෂධ අතිශයින් විෂ සහිතය. ඒවා ක්‍රමානුකූලව පරිහරණය නොකිරීම හේතු කොට ගෙන මිය යන රෝගීන්ගේ සංඛ්‍යාව සුළු පටු නොවන බව නොරහසකි. සමහර අවස්ථාවලදී නූතන වෛද්‍ය විද්‍යාවෙන් කරනු ලබන්නේ රෝගීන් පරලොවට වඩාත් වේගයෙන් පලවා හැරීමය. ආයුර්වේදයෙන් කරනු ලබන්නේ එවැනි රෝගීන්ට පරලොවට යැමට ඉඩ හැරීමය.

ඇත්ත වශයෙන්ම මිනිස් සිරුරට බොහෝ රෝගවලින් සුවපත් වීමේ ආවේණික හැකියාව තිබේ. එවැනි රෝග සම්බන්ධයෙන් සිරුරට හානිදායක නොවන කුමන කුමන ප්‍රතිකර්මයක් කළත් නොකළත් යහපත් ප්‍රතිඵල ලැබේ. නිතැතින් සුව වන සැම රෝගයක් පිළිබඳවම ආයුර්වේදයෙන් ලැබෙන ප්‍රතිඵල නූතන වෛද්‍ය විද්‍යාවෙන් ලැබෙන ප්‍රතිඵලවලට නොදෙවෙනි වන බවට සැකයක් නැත. යුනානි, සිද්ධ, හෝමියෝපති, දෙහි කැපීම ආදි ප්‍රතිකර්ම මගින් ද එවැනිම සතුටුදායක ප්‍රතිඵල ලබාගත හැකිය. රෝගියා සුවපත් වන්නේ ප්‍රතිකර්මයේ අනුභාවයෙන් නොව සිරුරේ ආවේණික ප්‍රතිශක්තියෙන් වන



බැවිනි. කිසියම් ප්‍රතිකර්මයක් යෙදුවායින් පසුව රෝගියෙකු සුවපත් වීමෙන් රෝගියා සුවපත් වූයේ ඒ ප්‍රතිකර්මය හේතු කොට ගෙනය කියා නිගමනය කිරීමට ප්‍රමාණවත් සාක්ෂ්‍ය නොවන බව අවධාරණය කළ යුතුව ඇත. නූතන වෛද්‍ය විද්‍යාත්මක ප්‍රතිකර්ම සහ ආයුර්වේද ප්‍රතිකර්ම අතර. තිබෙන සමානකම් සහ වෙනස්කම් කවරේ ද යන්න විමසා බැලීමෙන් මේ වෛද්‍ය ක්‍රම දෙකම රෝගීන්ට ප්‍රතිකාර කරන්නේ පොදු මූල ධර්ම කීපයකට අනුකූලව බව පෙනේ.

රෝගියාට හානියක් නොකිරීම. විවේකය උපයෝගී කර ගැනීම. ක්‍රියාකාරිත්වය උපයෝගි කර ගැනීම. අයහපත් පරිසරයකින් මුද ගැනීම. ඌනතාවයක් පිරිමැසීම. අධික්‍යය අඩු කිරීම. රෝගියා කම්පනයට භාජන කිරීම. ශරීරයේ ප්‍රතිශක්තීන් වැඩි කිරීම. රෝග ලක්ෂණ සමනය කිරීම. ප්‍රතිකාර කළ යුතු නිසා ප්‍රතිකාර කිරීම යන කරුණු සියල්ල සලකා බලන කල ආයුර්වේදය පිළිබඳව එක් නිගමනයකට අපට එළඹිය හැකිය. එනම්. අද ආයුර්වේදයේ භාවිතා කරනු ලබන ප්‍රතිකර්ම රාශියකට පදනම් වී ඇත්තේ. නූතන වෛද්‍ය විද්‍යාව භාවිතා කරනු ලබන ප්‍රතිකර්ම මූලධර්ම බවය. තවද ආයුර්වේදයේ භාවිතා කරනු ලබන ඖෂධ රසායනික වශයෙන් නිෂ්ඵල බව යථා කාලයෙහිදී ඔප්පු වුවත්. ඒවා භාවිතයෙන් ශාරීරික රෝගවලින් පෙළෙන 35% ටත්. මානසික රෝගවලින් පෙළෙන 40% ටත් තාවකාලික සුවයක් හෝ ලැබෙනු ඇත.

වෛද්‍යවරුන් කේන්ද්‍ර කොට ගත් සෞඛ්‍ය සේවයකට වඩා ප්‍රජාව මත පදනම් වූ සෞඛ්‍ය සේවයක් බහුජන හිතෛෂී බව ජගත් සෞඛ්‍ය සංවිධානය පවා අද අවධාරණය කරයි. මෙනයින් බලන කල ද අපට හුරු පුරුදු අපේම ආයුර්වේදය ප්‍රජා සෞඛ්‍ය සේවක අඩිතාලම කර ගැනීම යුක්ති යුක්තය. පලදායීය. ආර්ථික වශයෙන් ද ලාභදායකය.